# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2020 මැයි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දූරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2020 මැයි මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 5.2%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය අප්‍රේල් මාසයේ මතුපිට උද්ධමනය 5.9%ක් ලෙස වාර්තා විය. 2020 මැයි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 4.8%ක හා ආහාර නොවන කාණ්ඩයේ 0.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2019 මැයි මාසයේ 3.5% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -0.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.7%ක් විය. 2019 මැයි මාසයට සාපේක්ෂව 2020 මැයි මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල්, සහල්, පොල්තෙල්, අළුත් මාළු, මිරිස් කුඩු සහ රතුළූණු යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2020 අප්‍රේල් මාසයේ 134.8ක් වූ දර්ශකාංකය 2020 මැයි මාසයේ 135.4ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2020 මැයි මාසයේ දර්ශකාංකය 0.6ක වැඩිවීමක් එනම් 0.4ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.49% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.02%කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට එළවළු, අළුත් මාළු, මයිසූර් පරිප්පු, පොල්තෙල්, කහ කුඩු, දෙහි, සීනි, කිරිපිටි, කරවල, අමු මිරිස්, කුකුල් මස්, රතුළූණු, ටින් මාළු, සහල්, තුනපහ කුඩු සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ලොකුළූණු, පොල්, පළතුරු, අර්තාපල්, සුදු ළූණු, වියළි මිරිස්, ගම්මිරිස් සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2020 මැයි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ (බුලත්) සහ 'විනෝදාත්මක හා සංස්කෘතික’ (පුවත් පත්) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම බලපා ඇත. කෙසේ වෙතත් ‘විවිධ භාණ්ඩ හා සේවා' (මෝටර් රථ රක්ෂණය) සහ 'ප්‍රවාහන' (වාහන මිළදී ගැනීම) යන කාණ්ඩවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට, ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ ‘රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එහෙත් 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', සෞඛ්‍ය', 'සන්නිවේදන', ‘අධ්‍යාපන’ සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2020 අප්‍රේල් මාසයේ 3.2% සිට 2020 මැයි මාසයේ 3.7% දක්වා වැඩිවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2019** | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 |
| | ජුනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 |
| | අගෝ. | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 |
| | සැප්. | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 |
| | ඔක්. | 131.9 | 134.4 | | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |
| **2020** | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |
| | පෙබ. | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව